# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1773/25 – 2012 අගෝස්තු 29 වැනි බදාදා – 2012.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

කැලෑ ඉඩම් සංරක්ෂණය කිරීම යටතේ ඉළුඹකන්ද වත්ත නමැති ඉඩම අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුකුළු කෝරලය, උඩපත්තුවේ ඉළුඹකන්ද ග්‍රාම නිලධාරී වසමේ අ.ග.සි. 932 හි අතිරේක අංක 01 හා පත්‍ර අංක 01 හි කැබලි අංක 848 සිට 851 (ඉඩම් කැබලි 04 ක්) දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්. 20.4489 ක් පමණ වූ ඉළුඹකන්ද වත්ත නමැති ඉඩම:

01. **කැබලි අංක 848**
ඉඩමේ නම: ඉළුඹකන්දවත්ත; හිමිකම් කියන අය: එච්. ඩී. පියදාස, අංක 280, පරාක්‍රම මාවත, පැලියගොඩ; ප්‍රමාණය: හෙක් 5.7801.

02. **කැබලි අංක 849**
ඉඩමේ නම: ඉළුඹකන්දවත්ත; හිමිකම් කියන අය: එච්. ඩී. පියදාස, අංක 280, පරාක්‍රම මාවත, පැලියගොඩ; ප්‍රමාණය: හෙක් 4.1265.

03. **කැබලි අංක 850**
ඉඩමේ නම: ඉළුඹකන්දවත්ත; හිමිකම් කියන අය: එච්. ඩී. පියදාස, අංක 280, පරාක්‍රම මාවත, පැලියගොඩ; ප්‍රමාණය: හෙක් 3.0013.

04. **කැබලි අංක 851**
ඉඩමේ නම: ඉළුඹකන්දවත්ත; හිමිකම් කියන අය: එච්. ඩී. පියදාස, අංක 280, පරාක්‍රම මාවත, පැලියගොඩ; ප්‍රමාණය: හෙක් 7.5410.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 නොවැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00 ට කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2012 නොවැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජී. ඩී. එල්. උදය කුමාරි
ප්‍රාදේශීය ලේකම්,
කලවාන.

2012 අගෝස්තු මස 22 වැනි දින,
කලවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 – 373

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ම/සං/03/226.

වර්ෂ 2011 ක්වූ අගෝස්තු මස 10 වැනි දින අංක 1718/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද

දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3810 දරන පිඹුරේ කැබලි අංක 166 කැබලි අංක 292, 293 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 292**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 25-30 පමණ වයසැති කොස් ගස් 02ක්, අවු. 40-50 පමණ වයසැති කොස් ගස් 01ක්, අවු. 8-10 පමණ වයසැති මහෝගනී ගස් 05, වැසිකිළියක්, ස්ථිර ගොඩනැගිලි 1ක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, ආධාරක තාප්පයක් සහ වතුර ටැංකියක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. අතුල ජයන්ත, අංක 52/7, ජයසිංහ මාවත, රාගම පාර, කඩවත ; ප්‍රමාණය: හෙක්. 0.2750.

**කැබලි අංක 293**

ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත ; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජේ. ඒ. ඩී. වී. ජේ. ජයසූරිය, අංක 300/42, ස්ටර්ලින් පාර, ඉහළ කරගහමුණ, කඩවත ; ප්‍රමාණය: හෙක්. 0.0167.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ කැබලි අංක 292-293 දක්වා 2012 සැප්තැම්බර් මස 26 වැනි දින පෙ.ව. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 සැප්තැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

තමරා ඩී පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
මහර.

2012 අගෝස්තු මස 24 වැනි දින,
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

09 – 374

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.